# ජන්තාඝර සහ භික්‍ෂු ස්වස්ථතාවෙහි අන්තර් සම්බන්ධතාව පිළිබඳ අධ්‍යයනයක්

කවුඩාගම්මන රතනසාර හිමි

## හැඳින්වීම

කායික හා මානසික ස්වස්ථතාව යහපත් ජීවන පැවැත්මකට අත්‍යවශ්‍ය අංගයකි. කායික ස්වස්ථතාවයෙන් වියුක්ත ආධ්‍යාත්මික සහනයක් සෙවීම අපහසු ය. පුද්ගලයාගේ කායික මානසික ස්වස්ථාවයට උපනිශ්‍රය වන ඉගැන්වීම්වලින් බුදුදහම සුසාධිත ය. ශාරීරික ස්වස්ථතාවෙහි වැදගත්කම පිළිබඳ බුදුසමය සාවධාන වූ බවට ජන්තාඝර පිළිබඳ ඉගැන්වීම් සූචනය කරයි. ජන්තාඝර ස්ථාපනය කරලීමේ මූලික අපේක්ෂාවන් කෙබඳු ද? ශ්‍රී ලංකේය ආරාම සංකීර්ණයන්හි ජන්තාඝර භාවිත වූයේ කෙසේද? යන ප්‍රස්තුත කෙරෙහි සාවධාන වෙමින් ජන්තාඝර සහ භික්ෂු ස්වස්ථතාවයෙහි අන්තර් සම්බන්ධතාවය පිළිබඳ මන්දාවලෝකයක් මෙහි දී සිදු කෙරේ.

## වාච්‍යාර්ථය

පාලියෙන් ජන්තාඝර යනුවෙන් හැඳින්වෙන්නේ භික්ෂූන්ගේ ශාරීරික සුවතාව ඇතිකරලීම සඳහා කරවන ලද ගොඩනැඟිලි විශේෂයකි (පාලි-සිංහල අකාරාදිය, 277). ජෙන්තාක, ජන්තා යන්න වාෂ්පය, වියළි සහ උණුසුම් යන අර්ථද්වීපනය සඳහා පාලියේ සහ සංස්කෘතයේ භාවිත ය (අභිධානප්පදීපිකාටීකා.; A Sanskrit English Dictionary Etimologically and Philologically Arranged, 424). ඝර, යනු ගෘහය ගෙවත් ගෙය යි (පාලි-සිංහල අකාරාදිය, 187). ඒ අනුව වාෂ්ප ගෘහය, උණුසුම් ගෘහය හෝ වාෂ්ප සඳහා වූ ගෘහය, උනුසුම සඳහා වූ ගෘහය වැනි අර්ථයක් මෙම පදයෙන් ධ්වනිත විය යුතු ය. එසේ වුව ද පාලි කෝෂ ග්‍රන්ථයක් වන අභිධානප්පදීපිකාව 'අග්ගිසාලා' යනුවෙන් ජන්තාඝරයට අර්ථ දක්වයි ( ''ජන්තාඝරං ත්වග්ගිසාලා,'' (අභිධානප්පදීපිකා, ප. 214). අභිධානප්පදීපිකා ටීකාව

'ජන්තාඝර' යන පදයෙහි සැකැස්ම විවරණය කරමින් ජන්තා යන්නෙන් දැල්වීම සහ ගින්න හටගනියි යන අදහසත්, ඒ සඳහා වන ගෘහය ජන්තාඝර නම් වන බවත් කියයි. එසේ ම ගින්න උදෙසා වූ ශාලාව අග්ගිසාලා (ගිනිහල්ගෙය) නම් වේ යනුවෙන් ද විවරණය කරනු ලැබේ. ''ජලන්ති එත්ථාති ජන්තා, ජල දිත්තියං, අන්තො, 'ඉත්ථියමතියවො වා'ති අ, ආ, ලලොපො, ජනෙතයත්‍ර අග්ගින්ති වා ජන්තා, ජන ජනනෙ, අන්තො, සා එව ඝරං ජන්තාඝරං. අග්ගිනො සාලා අග්ගිසාලා.'' (අභිධානප්පදීපිකා ටීකා, CSCD Rom) දම්පියා අටුවා ගැටපදයේ ද ජන්තාඝරය ගිනිහල්ගෙය වශයෙන් අර්ථ දක්වා ඇත (ධම්පියා අටුවා ගැටපදය, 116). එයින් පැහැදිලි වන්නේ, ශ්‍රී ලාංකික බොහෝ ග්‍රන්ථවල ත්‍රිපිටකාගත 'ජන්තාඝර' යන්න 'ගිනිහල් ගෙය' යනුවෙන් ඉතා සරලාර්ථයකින් සලකා ඇති බවකි.

**ජන්තාඝර බුදුසමයට සම්බන්ධවීමේ පසුබිම**

බුද්ධකාලීන විශාලා මහනුවර ප්‍රදේශය සැප සම්පත්වලින් ආඪ්‍ය ප්‍රදේශයක් විය. එහි වාසය කළ භික්ෂූන් වහන්සේට ප්‍රණීත ආහාරපාන වර්ග පිණ්ඩපාතය වශයෙන් ලැබුණු බැවින් භික්ෂූහු වැඩුණු සිරුරු ඇත්තාහු වූහ. එබැවින් බොහෝ ආබාධයන්ට ද ලක්වුණි. විශාලා මහනුවරට පැමිණි කෝමාරභච්ච ජීවක වෛද්‍යවරයා එම තත්ත්වය දැක භික්ෂූන් වහන්සේලා එයින් ආරක්ෂා කරගැනීම සඳහා ජන්තාඝරය සහ සක්මන්මළුව භාවිතයට සුදුසු බව බුදුන්වහන්සේට පවසා තිබේ.

''තෙන ඛො පන සමයෙන වෙසාලියං පණීතානං භත්තානං භත්තපටිපාටි අට්ඨිතා හොති. භික්ඛූ පණීතානි භොජනානි භුඤ්ජිත්වා අභිසන්නකායා හොන්ති බහ්වාබාධා. අථ ඛො ජීවකො කොමාරභච්චො වෙසාලිං අගමාසි කෙනචිදෙව කරණීයෙන. අද්දසා ඛො ජීවකො කොමාරභච්චො භික්ඛූ අභිසන්නකායෙ බහ්වාබාධෙ. දිස්වාන යෙන භගවා තෙනුපසඞ්කමි, උපසඞ්කමිත්වා භගවන්තං අභිවාදෙත්වා එකමන්තං නිසීදි. එකමන්තං නිසින්නො ඛො ජීවකො කොමාරභච්චො භගවන්තං එතදවොච. 'එතරහි, භන්තෙ, භික්ඛූ අභිසන්නකායා බහ්වාබාධා. සාධු, භන්තෙ, භගවා භික්ඛූනං චඞ්කමඤ්ච ජන්තාඝරඤ්ච අනුජානාතු. එවං භික්ඛූ අප්පාබාධා

භවිස්සන්තී'ති. අථ ඛො භගවා ජීවකං කොමාරභච්චං ධම්මියා කථාය සන්දස්සෙසි සමාදපෙසි සමුත්තෙජෙසි සම්පහංසෙසි. අථ ඛො ජීවකො කොමාරභච්චො භගවතා ධම්මියා කථාය සන්දස්සිතො සමාදපිතො සමුත්තෙජිතො සම්පහංසිතො උට්ඨායාසනා භගවන්තං අභිවාදෙත්වා පදක්ඛිණං කත්වා පක්කාමි. අථ ඛො භගවා එතස්මිං නිදානෙ එතස්මිං පකරණෙ ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි -'අනුජානාමි, භික්ඛවෙ, චඞ්කමඤ්ච ජන්තාඝරඤ්චා'ති'' (චුල්ලවග්ග පාලි II, 43)

කරුණු සලකා බැලූ බුදුරජාණන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට ජන්තාඝාර සහ සක්මන්මළු භාවිතයට අවකාශ ලබා දුන්හ. එතැන් පටන් ජන්තාඝරය ආරාමික වාස්තු විද්‍යාත්මක අංගයක් බවට පත් විය. ඒ වනවිටත් එනමින් හැඳින්වෙන ස්ථාන භාරතයෙහි ප්‍රචලිතව පවතින්නට ඇතැයි උපකල්පනය කළ හැකි ය.

ජීවක වෛද්‍යවරයාගේ ඉල්ලීමෙන් පසු ආරාම සැලසුම් කිරීමේදී එයට ජන්තාඝරය ද ඇතුළත් විය. ජන්ථාඝර ස්ථාපනයෙන් පසු ව ඇති වූ ප්‍රායෝගික ගැටලු පිළිබඳ සලකා බලමින් නොයෙක් විනය නීති සහ ප්‍රඥප්ති එකතු වූ ආකාරය චුල්ලවග්ගපාලියෙහි ඛුද්දකවත්ථු ඛන්දකයෙන් පැහැදිලි වේ (චුල්ලවග්ග පාලි II, 42 - 54). ජන්තාඝර ඉදිකිරීමෙහි මුල් අවස්ථාව පිළිබඳ තොරතුරු චුල්ලවග්ග පාලියේ සඳහන් වේ. පසු ව යම් යම් හේතු කාරණා පදනම් කරගෙන ජන්තාඝරයට එක් එක් කොටස් එකතු වී සංකීර්ණත්වයට පත් වූ බව පැහැදිලි වේ. ජන්තාඝර පරිහරණයට අවසර ලැබුණු මුල් කාලයේ භූමිය පිළිබඳ සැලකිල්ලක් නොදක්වා ඒවා ඉදිකර තිබුණි. එබැවින් නිරන්තර ජලගැලීම්වලට ජන්තාඝර යටවුණි. එම ජල ගැලීම්වලදී ආරක්ෂා කරගැනීම සඳහා උස්වේදිකාවක් මත ජන්තාඝර ඉදිකරන ලෙස බුදුරජාණන් වහන්සේ අනුදැන වදාළහ. එකල මෙය ප්‍රමාණයෙන් කුඩා ගොඩනැගිල්ලකි. පසුව ක්‍රමික ව වාත කවුළු, අගුළු සහිත දොරවල්, දුම් පිට කරණ කවුළු, පියස්ස, බිම මඩවන ගල්, ගඩොල් ඇතුරුම, ගිනිහල් පුටුව, ජලය බැස යන සොරොව්ව, සිවුරු තබාගැනීමට ශාලාවක්, සිවුරු එල්ලන ස්ථාන, ජලය ලබාගැනීමට ළිඳක්, ජලය අදින්න බාල්දිය, බොලොක්කය, දියඹරුව මඩ ඔරුව (චුල්ලවග්ග පාලි II, 49-53) යන අංගයන්ගෙන් ජන්තාඝරය

සමන්විත විය. වර්තමාන පුරාවිද්‍යා පර්යේෂණවලින් හමුවූ සියලු ජන්තාඝරවල මෙකී අංග සියල්ලක් ම පාහේ දක්නට ලැබේ. එනම් විනය පිටකයේ ජන්තාඝර ගොඩනැගිල්ල නිර්මාණය කිරීම සඳහා ලබාදී ඇති උපදෙස්වලට ගරු කරමින් මෙය නිර්මාණය කර ඇති බව පැහැදිලි වේ. ඉදිරිපස කුටියකින් ද උෂ්ණ කාමරයකින් ද ස්නානය සඳහා පොකුණකින් ද සමන්විත ජන්තාඝර මධ්‍යයෙහි පීඨිකාවක් ද පැවති බව දක්නට ලැබේ.

**ජන්තාඝරයෙහි කාර්යය**

හිම පතිත වන පෙදෙස්වල දී හිම පථනයෙන් ශරීරයෙහි ඇතිවන චර්ම රෝගාදිය වළක්වනු පිණිස ශරීරය උණුසුම් කරනු ලබන ස්ථානය ජන්තාඝරයයැයි සමන්තපාසාදිකාවේ දී විස්තර වේ (සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා III, 25). විනයාලංකාර ටීකාව දක්වන කරුණුවලට අනුව ජන්තාඝර යනු සිරුර උණුසුම් කොට දහඩිය පිටකිරීම සඳහා ඉදිකළ ගොඩනැගිල්ලකි ''සරීරං. ජං තායති රක්ඛතීති ජන්තා, කා සා? තිකිච්ඡා. ගය්හතෙති ඝරං, කිං තං? නිවෙසනං, ජන්තාය සරීරතිකිච්ඡාය කතං ඝරං ජන්තාඝරං'' (විනයාලංකාර ටීකා). ශීත රටවල භාවිත කෙරෙන ගෘශ විශේෂයක් ලෙස විමතිවිනෝදනිය ද ජන්තාඝර හඳුන්වා දෙයි. ''ජන්තාඝරං හි නාම හිමපාත බහුලෙසු දෙසෙසු තප්පච්චය රෝග පීසාදි නිවාරණත්ථං...'' (විමතිවීනෝදනී ටීකා, 369). මංජු ශ්‍රී භාෂිත වාස්තුවිද්‍යා කෘතියෙහි එම ගොඩනැගිලි විශේෂය හඳුන්වනු ලබන්නේ 'වාරිශාලා' නමිනි (Manjusri Vastuvidyasastra, 292). ඒ අනුව උෂ්ණාධික වාෂ්ප භාවිතයෙන් ශරීරයෙහි දහඩිය පිටකර ස්ථුලතාව අවම කරලීමේ අපේක්ෂාවෙන් ගොඩනංවන ලද ස්ථානයක් ලෙස ජන්තාඝරය හඳුනාගත හැකි ය.

ජන්තාඝරය තුළ සිදු වූ කාර්යය පිළිබඳ තොරතුරු විනය පිටකයේ සඳහන් වේ. වරක් ඡබ්බග්ගිය භික්ෂූන් වහන්සේලා ජන්තාඝරයෙහි විශාල වශයෙන් දර ගොඩ ගසා ගිනි අවුළුවා ඇතුළත භික්ෂූන් වහන්සේලා සිටිය දී දොරවසා එළියට වී සිටියහ. එතුළ අවශ්‍ය ප්‍රමාණයටත් වඩා උණුසුම් වීම නිසා භික්ෂූහු ක්ලාන්ත වූහ. මෙය දැනගත් බුදුරජාණන් වහන්සේ එලෙස භික්ෂූන් ඇතුළුව සිටිය දී දොර වසා තැබීම තහනම් කළහ.

''තෙන ඛො පන සමයෙන ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදන්ති. භික්ඛූ ඤෙුරා ච භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතා පපතන්ති. යෙ තෙ භික්ඛූ අප්පිච්ඡා…පෙ.… තෙ උජ්ඣායන්ති ඛියන්ති විපාචෙන්ති. කථඤ්හි නාම ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදිස්සන්ති! භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතා පපතන්තී'ති. අථ ඛො තෙ භික්ඛූ භගවතො එතමත්ථං ආරොචෙසුං. සච්චං කිර, භික්ඛවෙ, ඡබ්බග්ගියා භික්ඛූ ජන්තාඝරෙ ථෙරෙහි භික්ඛූහි නිවාරියමානා අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගිං දත්වා ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදන්ති; භික්ඛූ උණ්හාභිතත්තා ද්වාරං අලභමානා මුච්ඡිතා පපතන්තී'ති? 'සච්චං භගවා'ති. විගරහිත්වා…පෙ.… ධම්මිං කථං කත්වා භික්ඛූ ආමන්තෙසි. භික්ඛවෙ, ජන්තාඝරෙ ථෙරෙන භික්ඛුනා නිවාරියමානෙන අනාදරියං පටිච්ච පහූතං කට්ඨං ආරොපෙත්වා අග්ගි දාතබ්බො. යො දදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස. න, භික්ඛවෙ, ද්වාරං ථකෙත්වා ද්වාරෙ නිසීදිතබ්බං. යො නිසීදෙය්‍ය, ආපත්ති දුක්කටස්ස'' (චුල්ලවග්ග පාලි II, 368)

ජන්තාඝරය අභ්‍යන්තරයේ දී අධික වශයෙන් දහඩිය පිටවන විට පිපාසය ඇති වේ. එවිට පානය කළ හැකි මට්ටමේ පවතින උණුසුම් ජලය දිය යුතු බව විනයෙ පිටකයෙහි දක්වේ. ජන්තාඝරයේ දී මුහුණට රස්නය වැදීම වළක්වාලීම සඳහා මුහුණේ මැටි ආලේප කිරීමට භික්ෂූන්ට අවසර ලැබුණි.

''ජන්තාඝරෙ අග්ගි මුඛං ඩහති…අනුජානාමි, භික්ඛවෙ, මුඛමත්තික'න්ති. හත්ථෙ මත්තිකං තෙමෙන්ති…අනුජානාමි, භික්ඛවෙ, මත්තිකාදොණික'න්ති. මත්තිකා දුග්ගන්ධා හොති…අනුජානාමි, භික්ඛවෙ, වාසෙතු'න්ති.'' (චුල්ලවග්ග පාලි II, 47)

ජන්තාඝරයේදී උපාධ්‍යායන් වහන්සේට මත්තිකා (මැටි) සූදානම් කරදිය යුතු බව ද සඳහන් ය. එම මැටි දුගඳ හමනවා නම් එයට සුවඳ වර්ග ද එක්කළ හැකි ය (චුල්ලවග්ග පාලි II, 47). මැටි

පිළියෙල කරගැනීමට යොදා ගත් ඇඹරුම්ගල් 4ක් අභයගිරි විහාර ආරාම සංකීර්ණයේ අංක 1 සංඝාවාසයට සම්බන්ධ ජන්තාඝරයෙන් හමුවී ඇත. ඒවායේ භාවිත කළ අත්ගල් ද හමු විය. අරංකැලේ ජන්තාඝරයෙහි මිරිස් ගල්වලට සමාන ඇඹරුම්ගල් දෙකක් සහ අත්ගල් ද එහි තිබී සොයාගෙන තිබේ. අවශ්‍ය කරන මැටි ජන්තාඝරය තුළ ම සකස් කළ බව එයින් පැහැදිලි වේ. ස්නානය පිණිස උණු හෝ සිසිල් ජලය යන දෙක ම ජන්තාඝරයෙහි දී භාවිත කළ බව විනය පිටකයේ සඳහන් කරුණුවලින් පැහැදිලි වේ (චුල්ලවග්ග පාළි II, 45).

ජන්තාඝරයේදී අනුගමනය කළ යුතු වත් පිළිවෙත් විනය පිටකයේ සඳහන් වේ. උපාධ්‍යායන් වහන්සේ ජන්තාඝරයට ප්‍රවේශවීම සඳහා සූදානම් වන අවස්ථාවලට අවශ්‍ය කරන නෑමට පෙර භාවිත කරන චූර්ණ වර්ග තෙමා ගෙනත් තැබිය යුතු ය. ජන්තාඝර පීඨය (ඉඳගන්නා පුටුව) රැගෙන උපාධ්‍යායයන් සමඟ ජන්තාඝරයට පිවිසෙන්නා මන්තිකාවලින් දත් මැද ඉදිරිපස දොරවල් වසා පිවිසිය යුතු ය. උපාධ්‍යායයන්ගේ සිවුරු ලබාගෙන දුම් නොවදින තැනක තැබිය යුතුවේ. මේ තුළදී උපාධ්‍යායයන්ට පරිකර්ම ද කළ යුතු වේ. අඟුරු, මැටි, උණු දිය ආදි සියල්ල දිය යුතුය. ජන්තාඝරයෙන් පිටවන විට ජන්තාඝර පීඨය ද රැගෙන ඉදිරිපස දොරවල් වසා නික්මිය යුතු ය. තමන් පළමුවෙන්ම නා ඇඟ පිස දමා ගොඩ වී පසු ව උපාධ්‍යායයන් වහන්සේගේ ඇඟ පිස අඳනය දී පසුව සංඝාටිය දිය යුතු ය. ජන්තාඝරයෙහි වූ උෂ්ණය නිසා පිපාසාව ඇති වේ. ජලය අවශ්‍යදැයි විචාරා ජලය දිය යුතු වේ. මේ අයුරින් ආචාර්ය උපාධ්‍යායන් වහන්සේලාට ජන්තාඝරයේ දී වතාවත් කළ යුතු ද වේ. ජන්තාඝරයට මුලින් ම යන්නා විසින් එය ශුද්ධ පවිත්‍ර කිරීමට අවශ්‍යදැයි සොයා ලබා ඒ කටයුතු කළ යුතු ය. එමෙන් ම ජන්තාඝාරයෙන් අවසාන වරට පිටවන අය විසින් ද එය පිරිසිදු කර තබා ඉන් පිටවිය යුතු වේ. එනම් එහි ද පරිහරණය කරන ලද සියලු බඩු බාහිරාදිය නිසි සේ පිරිසිදු කර ඒවා තිබූ ස්ථානවල ම නැවත තැබිය යුතු ය (චුල්ලවග්ග පාළි II, 369-371). මෙම සියලු වත් පිළිවෙත් ජන්තාඝරයේ පැවැත්මට හේතු වේ.

මෙම ක්‍රමය ශාරීරික සුවතාව ඇතිකර ලීම සඳහා පැරණි ඉන්දියාවේ භාවිත ප්‍රතිකාර ක්‍රමයකි. පැරණි ඉන්දියාවේ ජෙන්තාක ස්වේදනය යනුවෙන් ප්‍රතිකර්ම ක්‍රමයක් පැවති බව චරක සංහිතාවේ

සඳහන් වේ (චරක සංහිතාව, 91 - 92). චරක සංහිතාවට අනුව එය සිදුකරන ගෘහය ගෝලාකාර කුටාගාරයකි. එය නිර්මාණය කරන්නේ රෝගියාගේ ගමට නැගෙනහිරින් හෝ උතුරු දෙසින් ය. අපවිත්‍ර නොවූ කළු හෝ රන්වන් පැහැපත් මැටි පසින් යුක්ත ප්‍රශස්ත භූමියක් ඒ සඳහා භාවිත කළ යුතු වේ. ගං හෝ පොකුණු ආදී ජලාශයක දකුණු හෝ බස්නාහිර ප්‍රදේශයේ ජලාශයට නුදුරින් වූ සමතලා භූමි භාගයක කුටාගාරය ස්ථානගත කෙරුණු බව චරක සංහිතාවෙන් පැහැදිලි වේ. එම කුටියෙහි උස හා පළල 16 රියන් විය යුතු අතර බොහෝ කවුළු ද තැබිය යුතු වේ. එසේ ම ගෘහයෙහි බිත්තියට යාබදව රියනක් පමණ උසින් හා පළලින් යුක්ත පිළක් මැටියෙන් සැදිය යුතු ය.

කුටිය මැද සිවු රියාන් දිග හා පළල ඇති පුරුෂයෙකු සමාන උසට බොහෝ කුඩා සිදුරුවලින් යුක්ත ස්ථම්භයක් (පෝරණුවක්) මැටියෙන් සාදනු ලැබේ. එහි මුදුන් විවරය පමණක් මැටියෙන් සෑදූ පියනකින් වසා දමයි. පසුව එම ස්ථම්භය ඇතුලට කිහිරි බුරුත ආදී දර වලින් පුරවා ගිනි දල්වනු ලැබේ. දර මනා ලෙස දැවී දුම් රහිත වී මුළු ගෙය ම උණුසුම් වේ. ස්වේදනය ට යෝග්‍ය වන පරිදි ගෘහය උණුසුම් වූ පසුව වාතහාර තෙලකින් රෝගී පුද්ගලයා අභ්‍යංගය කරවා රෙදි පොරවා ගෙතුලට පමුණුවනු ලබයි. ඔහුට ලබා දෙනු ලබන උපදෙස් පහත පරිදි ය.

හිතවත යහපත සඳහා නිරෝගී බව සඳහා මෙම ගෙට පිවිස පිලට නැග තමන්ට සුව පහසු යැයි හැඟෙන පැත්තකට හැරී වැතිරෙන්න. අධික දහඩියෙන් හා මූර්ජාවෙන් කොපමණ පීඩා ඇති වුවත් ප්‍රාණය ඇති තෙක් පිලෙන් බැහැරට නොයා යුතුය. යම් හෙයකින් පිල අත්හැර දමා දොර දෙසට යන්නේ නම් දහඩිය දැමීමෙන් හා මූර්ජාවෙන් ක්ෂණයකින් මිය යා හැකි ය. දෝෂ ධාතුවල සෝත්‍ර ස්‍රෝතස් සමූහයාගේ බැඳීම් බව දුරු වූයේ ය. ශරීරය සැහැල්ලු වූයේය සිරුරේ බැඳීම්, තද බව, ස්පර්ශ ඥාන රහිත බව, වේදනාබර බව ආදි සියල්ල පහ වූ බව දැනුණු විට පිල අතහැර දොර දෙසට පැමිණිය හැකි ය. එසේ වුව ද දොර දෙසට ආ පමණින් ඇසට සිසිල් දිය නොදැමිය යුතු ය. මඳ වේලාවක් විවේකීව ගත කොට අධික උෂ්ණත්වය නිසා වූ ක්ලාන්තගතිය පහ වූ පසු මදක් උණුසුම් ජලය ස්නානය කොට ආහාර අනුභව කළ යුතු ය.

''අථ ජේන්තාකං චිකීර්ෂුර්භූමිං පරීක්ෂේත තත්‍ර පූර්වස්‍යාං දිශ්‍යුත්තරස්‍යාං වා ගුණවති ප්‍රශස්තේ භූමිභාගේ කෘෂ්ණමධුරමෘත්තිකේ සුවර්ණමෘත්තිකේවා පරීවාපපුෂ්කරිණ්‍යාදීනාං ජලාශයානාමන්‍යතමස්‍ය කූලේ දක්ෂිණේ පශ්චිමේ වා සූපතීර්ථේ සමසුවිභක්තභූමිභාගේ සප්තාෂ්ටෞවා (අ) රත්නීරුපක්‍රම්‍යෝදකාත් ප්‍රාඞ්මුඛමුදඞ්මුඛං වා(අ)භිමුඛතීර්ථං කූටාගාරං කාරයේත්, උත්සේධවිස්තාරතඃ පරමරත්නීඃ ෂෝඩශ, සමන්තාත්සුවෘත්තං මෘත්කර්මසම්පන්න මනේකවාතායනම්; අස්‍ය කූටාගාරස්‍යාන්තඃ සමන්තතෝ භිත්තිමරත්නි විස්තාරෝත්සේධාං පිණ්ඩිකාංකාරයේදාකපාටාත්, මධ්‍යයෙ චාස්‍ය කූටාගාරස්‍ය චතුෂ්කිෂ්කුමාත්‍රං පුරුෂප්‍රමාණං මෘන්මයං කන්දු සංස්ථානං බහු සූක්ෂ්මච්ඡිද්‍රමඞ්ගාර කෝෂ්ඨක ස්තම්භං සපිධානං කාරයේත්; තං ච ඛාදිරාණාමාශ්වකර්ණාදීනාං වා කාෂ්ඨානාං පූරයිත්වා ප්‍රදීපයේත්; සයදා ජානීයාත් සාධු දග්ධානි කාෂ්ඨානි ගතධූමාන්‍යවතප්තං ච කේවලමග්නිනා තදග්නිගෘහං ස්වේදයෝග්‍යාන චෝෂ්මණා යුක්තමිති, තත්‍රෛනං පුරුෂං වාතහරාභ්‍යක්තගාත්‍රං වස්ත්‍රාවච්ඡන්නං ප්‍රවේශයේත්, ප්‍රවේශයංශ්චෛනමනුශිෂ්‍යාත්- සෞම්‍ය! ප්‍රවිශ කල්‍යාණායාරෝග්‍යාය චේති,ප්‍රවිශ්‍ය චෛනාං පිණ්ඩිකාමධිරුහ්‍ය පාර්ශ්වාපරපාර්ශ්වාභ්‍යාං යථාසුඛං ශයීථාඃ, න ච ත්වයා ස්වේදමූර්ච්ඡාපරීතේනාපි සතා පිණ්ඩිකෙෂාවිමෝක්තව්‍යා(ආ)ප්‍රාණෝච්ඡ්වාසාත්, භ්‍රශ්‍යමානෝ හ්‍යතඃ පිණ්ඩිවකාවකාශාද්ද්වාරමනධිගච්ඡන් ස්වේදමූර්ච්ඡාපරීතතයා සද්‍යඃප්‍රාණාඤ්ජහ්‍යාඃ, තස්මාත් පිණ්ඩිකාමේනාං න කථඤ්චන මුඤ්චේථාඃ; ත්වං යදා ජානීයාඃ- විගතාභිෂ්‍යන්දමාත්මානංසම්‍යක් ප්‍රස්‍රුතස්වේදපිච්ඡං සර්වස්‍රෝතෝවිමුක්තං ලඝුභූතමපගතවිබන්ධස් තම්භසුප්තිවේදනාගෞරවමිති, තතස්තාං පිණ්ඩිකාමනුසරන්ද්වාරං ප්‍රපද්‍යෝථඃ, නිෂ්ක්‍රම්‍ය ච න සහසා චක්ෂුෂෝඃ පරිපාලනාර්ථං ශීතෝදකමුපස්පෘශේථාඃ, අපගතසන්තාපක්ලමස්තු මුහූර්තාත් සුඛෝෂ්ණේනවාරිණා යථාන්‍යායං පරිෂික්තෝ(අ)ශ්නීයාඃ; ඉති ජේන්තාකස්වේදඃ'' (චරක සංහිතාව, 91 - 92).

රෝගාබාධ ගණනාවක් සමනය කරනු පිණිස ඉන්දීය සමාජය තුළ මෙම ප්‍රතිකාර ක්‍රමය නිරන්තරයෙන් භාවිත කොට ඇත. ආනන්ද තිස්ස කුමාර ගේ අදහස චරක සංහිතාවේ දැක්වෙන ජෙන්තාකස්වේදය සහ ජන්තාඝරය සාම්‍ය ලක්ෂණයන්ගෙන් යුක්ත වූ බව යි (තිස්ස කුමාර, 1991).

එසේ නම් ශ්‍රී ලාංකේය ග්‍රන්ථ ජන්ථාඝරය අග්ගිසාලා යන නමින් ව්‍යවහාර කර තිබෙන්නේ ඇයි ද යන ගැටලුව පැන නඟියි. මුල්කාලීන විනය ග්‍රන්ථ සලකා බැලීමේදී 'ජන්තාඝර' සහ 'අග්ගිසාලා' යනුවෙන් ස්ථාන දෙකක් පිළිබඳ කරුණු අනාවරණය කරගත හැකි ය. ජන්තාඝර අනුදැන වදාරන්නට යෙදුනේ ස්ථූල ශරීරය ඇති භික්ෂූන්ගේ ශරීර සෞඛ්‍යය කෙරෙහි සැලකිලිමත් වෙමිනි. චුල්ලවග්ග පාලියට අනුව අග්ගිසාලා හෙවත් ගිනිහල්ගෙයක් අනුදැන වැදෑරීමට සිදු වූයේ ගිනි දැල්වීම සඳහා ආරාම සංකීර්ණවල නොයෙක් තැන්වල ළිප් බැඳීමෙන් ආරාම භූමිය අපවිත්‍ර වූ බැවිනි. බොහෝවිට පානය කිරීමට අවශ්‍ය උණුපැන් සපයා ගැනීම ආදී කටයුතු උදෙසා ළිප් බැඳගත් ස්ථානය අග්ගිසාලා නම් විය.

ජන්තාඝර යන්නට පැහැදිලි වාච්‍යාර්ථයක් නොලැබීමත්, එහි මූලික අභිප්‍රාය ගොඩනැගිල්ල තුළ උෂ්ණත්වය වැඩි කිරීම වූ බැවිනුත්, ජන්තාඝරය අභ්‍යන්තරයෙහි ගිනි දැල්වීම් සිදු කළ බැවිනුත් ශ්‍රී ලාංකේය කතුවරු විශේෂයක් නොකොට මෙම ස්ථාන දෙ ම අග්ගිසාලා ලෙස හඳුන්වා ඇති බව දක්නට ලැබේ. ජන්තාඝරයෙහි මූලික අභිප්‍රාය වී තිබෙන්නේ දහදිය පිට කිරීම මගින් ශාරීරික ස්වස්ථතාව ආරක්ෂා කරලීමයි. තත් අරමුණ සාධනය සඳහා ශ්‍රී ලංකාවේ ජන්තාඝාර ක්‍රියාත්මක වූයේ ද යන්න විද්වතුන්ගේ අවධානයට ලක්ව තිබේ (තිස්ස කුමාර, 1991: 66). ශ්‍රී ලාංකේය ජන්තාඝාරවල උණුදිය ස්නානය සිදුකළ ද දහදිය නැංවීම කෙරෙහි අවධානය යොමු නොකරන්නට ඇති බව ඔවුනගේ අදහස යි. උදකකොට්ඨකවල වූ බෙහෙත් ඔරුවල ගිලීමෙන් ජනතාඝරයෙහි දහඩිය නංවා කරන ප්‍රතිකර්මය කරගැනීමට භික්ෂූන් උත්සාහ කළේ දැයි සැක සහිත බව ආනන්ද තිස්ස කුමාරයන් ගේ අදහස යි (තිස්ස කුමාර, 1991: 66). දෝණිප්‍රවේශික නම් වූ දිය කොටුවක තබන ලද දෙනක වැතිර කරන ලද ස්වේද කර්මයක් බුදුන් වහන්සේ අනුදත් බව මහාවග්ග පාලියෙහි සඳහන් වේ (මහාවග්ගපාලි පිටුව, 532)

විමතිවිනෝදනී ටීකාවෙහි කර්තෘවරයා ජන්තාඝරය ලක්දිව අභාවිත යැයි උපකල්පනය කිරීමට සිදුවන කරුණු දක්වා තිබේ.

''ජන්තාඝරයක දැල්වෙන ගින්න දුම් රහිත ය. ජන්තාඝරය නම් හිම වැටීම බහුල ප්‍රදේශවල ඒ නිසා හටගත් රෝග පීඩාදිය නිවාරණය පිණිස ශරීරයේ ඩහ නැංවීමට කරන ලද ස්ථානයකි. එහි වනාහි අන්ධකාරයෙන් වැසුණු (පටිච්ඡන්න) කල්හි බොහෝ දෙනා එකාවන්ව පිවිසි චීවර බහා ගිනිරැස් වළක්වනු පිණිස මැටියෙන් මුහුණ අලෙව් දි දී සිරුරේ යම්තාක් ඩහ නංවාගෙන තාපනය කොට මැටිසුණු ආදිය සිරුරේ ගල්වාගෙන නහති.'' (විමතිවිනෝදනි, 369)

ශ්‍රී ලංකාවේ බොහොමයක් මූලාශ්‍ර ජන්තාඝර යනු ගිනිහල්ගෙය ලෙස දක්වා තිබීමත්, උක්ත විමතිවිනෝදනී සටහනත් මත ජන්තාඝාර ස්ථාපනය කිරීමේ මූලික අරමුණ සාධනය සඳහා ශ්‍රී ලංකාවේ ජන්තාඝාර ක්‍රියාත්මක වූයේ ද යනන පිළිබඳ සාධාරණ සැකයක් පැන නඟියි.

ඉන්දියාවේ මෙන් ම ශ්‍රී ලංකාවේ ඉදිකළ ආරාමවල ද ජන්තාඝර දක්නට ලැබේ. මහාවිහාරයේ ඉදිවිය යුතු ගොඩනැගිලි පිහිටන ස්ථාන වෙන්කළ අවස්ථාවේ රජගෙට උතුරු දෙසින් පිහිටි අලංකාර පොකුණක් අසළ ජන්තාඝර පොකුණ ඉදිවන බව මිහිඳු මාහිමියන් පැවසූ බව මහාවංසයේ සඳහන් වේ.

''තත්ථා'පි පුථුවී කම්පි, පුට්ඨො තස්සා'හ කාරණං;

ජන්තඝර පොක්ඛරණී, අයං හෙස්සති භූමිපී.''

(ඌනපූරණ සහිතො මහාවංසො, පරි. 15, ගා. 31)

ජන්තාඝරය සහිත පොකුණක් මහාවිහාරයෙන් හමු වේ (කුලතුංග 2018, 45). දීපවංසය දක්වන පරිදි භික්ෂුණීන්ගේ ප්‍රයෝජන පිණිස ජන්තාඝරයක් කුටකණ්ණතිස්ස රජු විසින් ඉදිකරවා තිබුණි. ''භික්ඛුනීනඤ්ච අත්ථාය ජන්තාඝරමකාරයි'' (දීපවංශය, පරි. 20, ගා. 34) එහෙත් භික්ෂූණීන් වහන්සේලාට ජන්තාඝර පරිභණය බුදුන් වහන්සේ විසින් වාරණය කර තිබුණි. භික්ෂූණීන් වහන්සේලා අතර ජන්තාඝරයක දී කෝලහාල ඇති වූ අවස්ථාවක එම පැණවීම සිදු කොට භික්ෂූණීන් ජන්තාඝරය ස්නානය කරන්නේ නම් දුකුළා ඇවැත් වන බව අවධාරණය කළහ.'' (චුල්ලවග්ග පාලි II, 536 - 537).

අනුරාධපුර විජයාරාම විහාර භූමියෙන් සොයා ගන්නා ලද ජන්තාඝරක් පිළිබඳව 1891 දී එච් සී පී බෙල් විසින් වාර්තා කරන ලදි. ඔහුගේ වාර්තාවට අනුව එහි ගිනි දැල් වූ බව උපකල්පනය කළ හැකි ස්ථානයෙන් අඟුරු සහ අලු හමුවී තිබේ (rchaeological Survey of Ceylon Fifth Progress, Report Apriel, june, Augest 1891, 6). වත්මන් පුරාවිද්‍යාත්මක පර්යේෂණ මගින් අභයගිරිය, අරංකැලේ, රිටිගල, පන්කුලිය, ජේතවනාරාමය සහ මිහින්තලය ආදි ස්ථානවලින් පැරැණි ජන්තාඝර සොයාගෙන ඇත. එම ස්ථානවල දක්නට ඇත්තේ ක්‍රමික ව සංවර්ධනය වූ ජන්තාඝර ය.

කටයුතු පහසුවෙන් ඉටු කරගැනීමට හැකිවන අයුරින් මේවායෙහි වාස්තු විද්‍යාත්මක සැලසුම සකස් කර තිබේ. පැරණි සංඝාරාමවල ඇති ජන්තාඝර බොහොමයක් දිග හතරැස් හැඩයෙන් යුක්ත ය. එනිසා ඒවා ශාලා වර්ගයේ ගොඩනැගිලි වශයෙන් හඳුනාගත හැකි ය. පරිහරණය කරන පිරිස් ප්‍රමාණය පිළිබඳ සැලකිලිමත් වෙමින් ගොඩනැගිල්ලෙහි විශාලත්වය තීරණය කරන්නට ඇත. අභයගිරියෙහි අංක 1 දරන ජන්තාඝරය ඍජුකෝණාස්‍රාකාර ය. පංචාවාසයෙහි භික්ෂූන්ට තනා ඇති ජන්තාඝරය සමචතුරස්‍රාකාර ය. මෙයින් පළමු වැන්න ශාලා වර්ගයටත් දෙවැන්න ගෘහ වර්ගයට අයත් වේ. ජන්තාඝරය අංග අතර, උදක දෝණිය වෙයි. එය මැදි කොට බිත්ති බැඳ වහලය සකසා ඇත. එම ගොඩනැගිල්ල වටකර ප්‍රාකාරයක් බැඳ තිබුණි. එම ප්‍රාකාරයෙන් ඇතුළත ප්‍රදේශය ජන්තාඝර පිරිවෙන යනුවෙන් හඳුන්වයි.

අභයගිරි ආරාම සංකීර්ණයෙන් ජන්තාඝර 05ක් හමු වී තිබේ. සුප්‍රසිද්ධ සමාධි බුද්ධ ප්‍රතිමාවට ආසන්න සංඝාරාමයට අනුබද්ධ ජන්තාඝරය ඒවා අතරින් කැපී පෙනේ. 1996 කැණීම් ආරම්භ කළ එම ස්ථානයෙන් ශ්‍රී ලාංකේය ජන්තාඝරයක සැකැස්ම අවබෝධ කරගත හැකි තරම් ප්‍රාමාණික සාක්ෂි හමු ව තිබේ. ස්නානය කිරීම පිණිස වූ ජල කොටුව, වැඩ හිඳීම පිණිස නිර්මිත ගල් පුවරු, අප ජලය පිට කිරීම පිණිස වූ උමං නළ මාර්ග, ඖෂධ ඇඹරුම් ස්ථාන ආදිය ඒ අතරින් සමහරකි (කුලතුංග, 2004, 52).

පධානඝර ආශ්‍රමවල ජන්තාඝර යැයි කිව හැකි ගොඩනැගිලි විශේෂයක් හමු වී තිබේ. ලංකාවෙන් හමු වී ඇති ජන්තාඝර සමස්ථයක් වශයෙන් බිම්ගල් ඇල්ලූ බේසමක හැඩය ගත් ඔරුවක් වැනි අංගයන්ගෙන් සමන්විත ය. ගල් අතුරන ලද දෝණිකාවෙහි නෙත්තිය ස්ථවිර භික්ෂූන් වහන්සේලා ගෝලයන් ලවා සිය සිවුර නහවා ගැනීමේ දී හිඳ ගැනීමට භාවිත කොට ඇත. එසේ ම භික්ෂූන් වහන්සේලාගේ සිවුරේ ගැල්වීම සඳහා නොයෙක් වර්ගයේ ආලේප තැනීමට භාවිත කරන ලද ඇඹරුම් ගල් ද එම ස්ථානවලින් හමු වී ඇත. එසේම දිය උණු කිරීම සඳහා භාවිත කරන ලද ලිප් තිබූ තැන් පැහැදිලි ව දක්නට ඇත. අරන්කැලේ ආරන්‍ය සේනාසන භූමියෙහි ඉපැරැණි ජන්තාඝරයක නටබුන් දක්නට ඇත. දිගින් අඩි 64කින් ද පළලින් අඩි 42 කින් ද යුකත එම ජන්තාඝරය විශාල භික්ෂු පිරිසකගේ පරිහරණය පිණිස ඉදිකරන ලද බව කිව හැකි ය. දිය උණු කිරීම සඳහා භාවිත කළ උඳුන් එම ජන්තාඝරවලින් හමු වේ. එහෙත් ජන්තාඝර පැණවීමේ දී අපේක්ෂා කළ අන්දමේ වාෂ්ප මගින් ශබ්ර ස්වස්ථතාව පවත්වාගැනීම වෙනුවට භික්ෂූන් වහන්සේ උණුදිය ස්නානය කරන ස්ථානය ලෙස වඩාත් සරලාවශ්‍යතාවක් ඉටුකරගනු පිණිස ඉදි වූ ගොඩනැගිලි විශේෂය ලක්දිව දී ජන්තාඝර ලෙස ක්‍රියාත්මකව ඇති බව පෙනේ. එම තත්ත්වය මත ශ්‍රී ලාංකේය පුරාවිද්‍යාඥයන් ද ජන්තාඝර යනු භික්ෂූන්ගේ ස්නාන ස්ථානයක් ලෙස හඳුන්වා ඇති අවස්ථා හමු වේ.

**සමාලෝචනය**

කායික හා මානසික සුවතාව නොමැති විට චිත්ත ඒකාග්‍රතාව ඇති කර ගත නො හැකි ය. බුදුන් වහන්සේ මෙම මනෝ විද්‍යාත්මක ක්‍රියාදාමය මැනවින් අවබෝධ කොටගත් අයෙකි. එබැවින් භික්ෂූන්ගේ කායික සුවතාව වර්ධනය කරලීමට උපයෝගී වන අංගයන් ආරාමික අංග අතරට ඇතුළත් කිරීමට බුදුන් වහන්සේ අවසර ලබා දුන්හ. ජන්තාඝරය ද එවැනි අංගයකි. බුදුන් වහන්සේ වාෂ්ප ස්නානය ස්ථූල භික්ෂූන් උදෙසා අනුදැන වදාරා ඇත. එම ක්‍රමවේදය බෝ නොවන රෝගවලින් ආරාක්ෂාවීමටත් ශාරීරික යෝග්‍යතාව පවත්වාගැනීමටත් බෙහෙවින් උපකාර වන්නට ඇත. එහෙත් කල් යාමේ දී එය ශීත රටවලට අදාළ කාර්යයක් ලෙස සැලකීම නිසා ශ්‍රී

ලංකාව තුළ භාවිත නොවන්නට ඇතියි උපකල්පනය කළ හැකි ය. එහෙත් උණුදිය ස්නානය පිණිස ගොඩනංවන ලද ගෘහ ජන්තාඝර ලෙස ව්‍යවහාර කරන ලද බව පැහැදිලි ය. එබැවින් ජන්තාඝරයන්හි කාර්ය භාරය අවබෝධ කරගැනීමට පුරාවිද්‍යාත්මක අධ්‍යයන පමණක් ප්‍රමාණික නොවන බව පෙනී යයි. ජන්තාඝර සම්බන්ධ ත්‍රිපිටකාගත ඉගැන්වීම් පිළිබඳ සාවධාන වෙමින් සිදු කරන අධ්‍යයන මගින් මෙම විෂය ක්ෂේත්‍රය පිළිබඳ පෘථුල අධ්‍යයනයකට අවකාශ විවර කරගත හැකි වනු ඇත. එසේ ම නූතන භික්ෂූණ් වහන්සේ බෝ නොවන රෝග බොහොමයකින් පෙළෙති. උන්වහන්සේලාගේ ශාරීරික යහ පැවැත්ම ඇතිකරනු පිණිස ප්‍රතිකාර ක්‍රමයක් ලෙස ද නූතනත්වයට යෝග්‍ය වන පරිදි වෙනස්කම් සහිතව ජන්තාඝර භාවිතයට ගත හැකි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

### ප්‍රාථමික මූලාශ්‍රය

අභිධානප්පදීපිකා. (සංස්.) වස්කඩුවේ වාචිස්සර හිමි (1921). කොළඹ: මහා බෝධි මුද්‍රණාලය.

අභිධානප්පදීපිකාටීකා. :1997). Chatta Sangayana CD Rom. Dharmagiri: Vipassana Research Institue.

ඌනපූරණ සහිතො මහාවංසො. (සංස්.) පොල්වත්තේ බුද්ධදත්ත හිමි (1959). කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

චරක සංහිතාව. (අනු.) ආර්. බුද්ධදාස (1960). කොළඹ: ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

දීපවංශය. (සංස්.) කිරිඇල්ලේ ඤාණවිමල හිමි (1970). කොළඹ: ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

ධම්පියා අටුවා ගැටපදය. (සංස්.) ඩී.ඊ. හෙට්ටිආරච්චි (1974). කොළඹ: සමයවර්ධන පොත්හල.

චුල්ලවග්ග පාලි II. (2005) බු.ජ.මු.ත්‍රි.මා. නැදිමාල: දෙහිවල.

විනයාලංකාර ටීකා. Chatta Sangayana CD Rom, Dharmagiri, Vipassana Research Institue, 1997.

විමතිවිනෝදනී ටීකා. (1935). කොළඹ: ලක්ෂ්මන් යන්ත්‍රණාලය.

සමන්තපාසාදිකා නාම විනයට්ඨකථා III. (1985). හේ. වි. මු. නවමුද්‍රණය.

Archaeological Survey of Ceylon Fifth Progress Report Apriel, june, Augest 1891. 1907.

Manjusri Vastuvidyasastra. (Ed.) Leelananda Prematilleke and Roland Silva (1995). Colombo: State Printing Corp.

**ද්විතියික මූලාශ්‍රය**

කුලතුංග, ටී.ජී. (2018). අනුරාධපුර මහා විහාරය, නුගේගොඩ: සරසවි ප්‍රකාශකයෝ.

කුලතුංග, ටී.ජී. (2004). අභයගිරි ලිපි, තරංජි ප්‍රින්ටර්ස්

තිස්ස කුමාර, ආනන්ද (1991). ජන්තාඝර සහ ජෙන්තාකස්වේද. වල්ගම්මුල්ලේ ශ්‍රී ප්‍රඥාරාම අභිස්තව සංග්‍රහය. (සංස්.) වැලමිටියාවේ ධම්මරක්ඛිත හිමි ඇතුළු පිරිස. විද්‍යාලංකාර.

පාලි-සිංහල අකාරාදිය, (සම්පාදක) පොල්වත්තේ බුද්ධදත්ත හිමි (1998). නැදිමාල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, .

ශබ්දාර්ථ රත්නාකරය හෙවත් සිංහල මහා අකාරාදිය, බෝරුගේගමුවේ ශ්‍රී රේවත හිමි (1929). කොළඹ: ජේ. සුදසිංහ.

A Sanskrit English Dictionary Etimologically and Philologically Arranged, (Ed.) M. Monier Williams (1899). Oxford: Oxford Uniesty Press.